# 40

ඔබ තුරුලට  වී ඉන්නට ඇත්නම්
එක වරුවක් හෝ දවසකදී
නිසසල මොහොතක හිමිදිරි උදයක
ඔබ සිරුරේ උණුසුමේ වෙලි
ජේසුනි මට ඔබ විශ්වාසයි ඔබ මගේ ජීවිතයයි
හැමදාමත් එහෙමයි – ඔබ තුරුලට වී

ගිනිගත් සිතිවිලි නිවෙනා තුරු මා ඔබ තුරුලේ ඉන්නම්
පව්වූ මගේ සිත සේදී යනතුරු ඔබ පා නමදින්නම්
තනි වෙන්නට කිසි දිනක ඉඩ නොදී ඔබ පසුපස එන්නම්
දෑතින් ඔබේ අත අල්ලාගෙන මා ගීයක් මුමුනන්නම්

දුකින් පෙළෙන මිනිසුන් අහුරක් ගෙන ඔබ පාමුල වැටෙම්
සැනසීමක් අයැදින්නට හිත හිත මල් දෝතක් පුදමි
විශ්වාසයි මට විශ්වාසයි කිසි දින මා අත නොහරියි
ඔබ දුන් හුස්මෙන් ජීවත් වන්නට මට දිරි ලැබෙනු ඇති